පෙරමුණ සතුව තිබිණි. එවකට මැතිවරණ කොමසාරිස්වරයා ව සිටි චන්ද්‍රානන්ද ද සිල්වා මහතා විසින් 1988 දී පමණ නිකුත් කරන ලද වාර්තාවෙන් ද ජනමත විචාරණ යේ ප්‍රතිඵලය අත්පත් කර ගැනීමේ දී අනිසි බලපෑම් යොදා ගෙන තිබුන බව තහවුරු වන තත්වයක් පෙනෙන්නට තිබුණි.

මෙම නීතිමය අභියෝගය ජය ගැනීම එවකට සිටි ජනාධිපතිවරයාට සහ ආණ්ඩුවට පහසු කරුණක් නොවීය. දකුණේ විසූ දෙමළ ජනයාට එරෙහිව 1983 කළු ජූලි ඝාතනය දියත් කරන ලද්දේ මේ කාලය අතරතුරේ දී ය. 1983 ජූලි මැද යුද හමුදා ප්‍රහාරයකින් දමිල ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ සාමාජිකයන් පිරිසක් මියැදුණ අතර ඊට පලි ගැනීම සඳහා කොටි සංවිධානය ජූලි 23 දා ප්‍රතිප්‍රහාරයක් එල්ල කොට තිබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස හමුදා භටයන් දහතුන් දෙනෙක් මිය ගියේය. ජනාධිපතිවරයාගේ උපදෙස් අනුව එවකට යුද හමුදාපති ව සිටි ලුතිනන් ජෙනරාල් තිස්ස වීරතුංග මියගිය සෙබළුන්ගේ සිරුරු බොරැල්ල කනත්තේ දී ජූලි 24 දා භූමදාන කිරීමට කටයුතු යොදා තිබිණි.
එදා කනත්තේ රැස් ව සිටි පිරිස අතරින් සමහර දෙනෙක් බොරැල්ල නගරයේ දෙමළ කඩ සාප්පුවලටත් අවට පිහිටි දෙමළ නිවෙස්වලටත් පහර දීම රට පුරා දෙමළ ජාතිකයන් සහ ඔවුන් සතු දේපළ විනාශ කිරීමට සන්නද්ධ වී සිටි කණ්ඩායම්වලට නිකුත් කරන ලද සංඥාවක් බඳු වූයේය. සෑම නගරයක ම පාහේ රජයේ දේශපාලනඥයන් විසින් මෙම ප්‍රහාර සැලසුම් කොට ක්‍රියාවට නංවා තිබුනි. මැතිවරණ ඡන්ද නාම ලේඛන අතැතිව දෙමළ ජාතිකයන්ට අයත් දේපොළ සොයා ගෙන ගොස් ප්‍රසිද්ධියේ මෙම ප්‍රහාර මෙහෙයවන ලද්දේ ජාතික සේවක සංගමයට සම්බන්ධව සිටි ඇතැම් නායකයන්, රජයේ ඇතැම් මන්ත්‍රීවරුන් සහ රජය හා සම්බන්ධකම් පැවැත්වූ ඇතැම් දාමරික කොටස් විසිනි.

මෙම ප්‍රහාරවලට දින දෙකක් ම ඉඩකඩ ලබා දුන් රජය ජූලි 26 දා කොළඹ ඇඳිරි නීතිය පැනවීය. ජනාධිපතිවරයා ජනතාව ඇමතූයේ ජූලි 28 දා ය. මිට සමාන්තරව සංවිධානාත්මක දෙමළ පිරිස් උතුරු නැනෙහිර පළාත්වල වසන සිංහල ජනයාට ප්‍රහාර එල්ල කොට තිබිණි. ජූලි 31 දා වන විට අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් ශ්‍රී ලංකා වේ කොමියුනිස්ට් පක්ෂය, නව සමසමාජ පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ තහනම් කරන ලදී. දෙමළ ජනයාට එරෙහිව ක්‍රියාත්මක වූ ප්‍රහාර මාලාව අන්ත වාදී වාමාංශික නායකයන්ගේ රාජ්‍යවිරෝධී කුමන්ත්‍රණයක් බවට වාර්තා ඔහුට ලැබී තිබෙන හෙයින් ඒ පක්ෂ තහනම් කල බව ජනාධිපතිවරයා ප්‍රකාශ කලේය.
1988-89 දක්වා දිවෙන දෑවැන්ත රාජ්‍යමර්දනයේ පදනම සකස් කෙරුණේ ඒ ආකාරයටයි. මෙම සිද්ධීන් යොදා ගෙන ජනතා විමුක්ති පෙරමුණ තහනම් කරන ලද්දේ ජනමත විචාරණ ප්‍රතිඵලය අභියෝග යට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම නිසා රජයට අත් වෙන්නට තිබුණු පරාජයෙන් බේරීම ද එක් අරමුණක් කර ගනිමිනි. රෝහණ විජේවීර සහෝදරයා රහසිගත බවට පත් විය. ඒ වන විට පක්ෂයේ නායකත්වය සමඟ ඇතිව තිබූ මත වෙනස්කම් හා මත ගැටුම් හේතුවෙන් මම පක්ෂයෙන් ඉවත් වෙන්නට තීරණය කොට සිටියෙමි. ඒ විශේෂ අවස්ථාවේ යටි බිම් ගත වෙන්නට රෝහණ සහෝදරයා ගත් තීරණයත් සමඟ ද මම එකඟ නොවූයෙමි.

1983 කළු ජූලි සමයේ දී හදිසි නීතිය යට තේ මා ද ඇතුළුව ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරිකයින් 17 දෙනෙක් පමණ රහස් පොලිසියේ හතරවෙනි තට්ටු වේ රඳවා ගන්නා ලදි. ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා ද එසේ රඳවා තිබූ එක් අයෙකි. සෑම මසකම අපව එසේ රඳවා තබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා විසින් අත්සන් කොට දෙන ලද නියෝගයක පිටපතක් අපට ලබා දිය යුතුව තිබුණි. මුල් මාස දෙකේ අපට එම පිටපත් ලැබුන නමුත් පසුව එවැනි පිටපත් අපට ලබා දුන්නේ නැත.

මේ නීති විරෝධී ක්‍රියාවට විරෝධය පෑම සඳහා අපව රඳවා සිටි කුටිවලින් ඉවතට පැමිණ රහස් පොලිස් ගොඩනැඟිල්ලෙන් පිටතට යා යුතු බව ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා යෝජනා කළේය. අප වැඩි දෙනෙක් ඒ යෝජනාවට එකඟ වූ අතර රහස් පොලිසියෙන් අප පැන යාමට තැත් කලේය යනුවෙන් මීට පෙර අත්හදා බලා තිබෙන සැබෑ කඩතුරාව යොදා ගෙන අපව මරා දමන්නට හැකි බව අපේ සමහරෙක් කල්පනා කලේය. ප්‍රින්ස් සහෝදරයාත් මාත් ඇතුළු අප වැඩි දෙනෙක් පවසා සිටියේ අවශ්‍ය නම් රඳවා සිටියදී වුවද අප මරා දැමිය හැකි බවත්, ඒ අවදානම දරා ගනිමින් අපේ විරෝධය පෑ යුතු බවත් ය.

එක් උදෑසනක සහකාර පොලිස් අධිකාරී පුණ්‍යා ද සිල්වා මහතා පළමුවැනි තට්ටුවට පැමිණ සිටි අවස්ථාවක ප්‍රින්ස් ගුණසේකර සහෝදරයාත් මමත් ඔහු හමුවට ගොස්, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් අත්සන් කළ නියෝගයක් අපට ලබා දී නොමැති නිසා අපව රඳවා ගෙන සිටීමට රහස් පොලීසියට අයිතියක් නැති බව කියා සිටියහ. අපව රඳවා සිටි කොටසේ දොරටු වෙන් පිටත් වූ අපි අනෙක් අයත් සමඟ එක්ව කොරිඩෝවට ඇවිද ගියෙමු. අප බිම් මාලය වෙත ඇති තරප්පු පෙළ අසලට ළඟා වන විට උප පොලිස් පරීක්ෂක චන්ද්‍රා වාකිෂ්ට මහතා උඩ තට්ටුවේ සිට සෝපානයෙන් පැමිණ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මුද්‍රාව තබන ලද පත්‍රිකා අපට පෙන්වා අප රඳවා ගෙන සිටින්නේ නීත්‍යානුකූලව බවත්, ඒ නිසා පිටත්ව ගිය හොත් අපට එරෙහිව බලය පාවිච්චි කරන්නට සිදු වෙන බවත් අවධාරණය කළේය. ඒ අනුව කුටිවලට ආපසු යන්නට අපට සිදු විය. මා බිරිඳ චිත්‍රා සහෝදරිය විසින් පසුව ජනාධිපති නීතිඥ නිමල් සේනානායක මහතාගේ ආධාරය ඇතිව අධිකරණයට ගොනු කරන ලද හෙබ යාස් කෝපුස් පෙත්සම හේතුවෙන් අප සියළු දෙනා කිසිදු චෝදනාවකින් තොරව නිදහස් කර හරින ලදී.

නිදහස ලබා එළියට පැමිණි පසු දිගින් දිගටම රජයට එරෙහිව කටයුතු කළ නමුත් ප්‍රින්ස් සහෝදරයා ජනතා විමුක්ති පෙරමුණ අනුගමනය කල ජාතිකවාදී ස්ථාවරය හා එකඟ ව කටයුතු කළේය. උතුරේ ජාතිකවාදී බෙදුම්වාදී අරගලයත් දකුණේ ජාතිකවාදී දේශප්‍රේමී සන්නද්ධ ව්‍යාපාරයත් රජයේ හමුදාත් අතර පැවති සන්නද්ධ සහ ත්‍රස්ත කටයුතු හමුවේ රට දැඩි අස්ථාවර භාවයකට පත්ව තිබිණි. මානව හිමිකම් වෙනුවෙන් නො සැලී කටයුතු කළ බොහෝ ක්‍රියාධරයන් මෙන්ම නීතිඥයන් ද අභිරහස් ලෙස ඝාතනයට ලක් විය. මේ සියළු අභියෝගයන් හමුවේ ප්‍රින්ස් සහෝදරයා මූලික මිනිස් අයිතිවාසිකම් වෙනුවෙන් නොකඩවා සටන් කළේය. රජයේ ආරක්ෂක අංශ ප්‍රා, කොළ කොටි, කළු බළල්ලු වැනි විවිධ නම්වලින් පෙනී සිටි පැර-මිලිටරි ඝාතක කණ්ඩායම් යොදා ගත්හ. ඔවුහු දහස් ගණනින් තරුණ තරුණියන් ඝාතනය කර දැමූහ. ඒ අතර ජනතා විමුක්ති පෙරමුණේ දේශපේමී සන්නද්ධ ව්‍යාපාරය තෝරා ගන්නා ලද දේශපාලන නායකයන්, ක්‍රියාධරයන් සහ සිය විධානවලට එකඟ නොවූ සිවිල් වැසියන් ද මරා දැමූහ.
ප්‍රින්ස් සහෝදරයාගේ වැඩිමහල් සොහොයුරියගේ පුතෙක් වූ නීතිඥ කාංචන අබේපාල සහෝදරයා ඝාතනය කිරීම නිකුත් කෙරුණු අවසාන සංඥාව විය. අතුරුදන් කිරීම් මෙන්ම අබිරහස් ලෙස මරා දැමීම් දිනපතා අත් දකින්නට ලැබුන සිදුවීම් බවට පත් විය. උත්සන්න වුනු රාජ්‍යප්‍රචණ්ඩත්වයත් ඒ හා සම්බන්ධව ජනතා විමුක්ති පෙරමුණ දියත් කොට තිබුනු සන්නද්ධ අරගලයත් හමුවේ 1989 දී රටෙන් බැහැර වී ඔහුගේත් ඔහුගේ පවුලේත් ජීවිත බේරා ගැනීම සඳහා දේශපාලන රැකවරණ ලබා ගන්නට ප්‍රින්ස් සහෝදරයාට සිදු විය. ෆිලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා ද තාවකාලික ව විදේශගත වූයේය. ජනමත විචාරණ ප්‍රතිඵලය අභියෝගයට ලක් කරමින් ජනතා විමුක්ති පෙරමුණ විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම නඩුවේ පෙත්සම් කරුවන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන්නට කිසිවකු උසාවියට නොපැමිණීම හේතුවක් ලෙස යොදා ගෙන නිශ්ප්‍රභ කරන ලදී.

මටත් මගේ පවුලේ අනෙක් සාමාජිකයන්ටත් එල්ල කරන ලද මරණ තර්ජන හමුවේ 1989 අග භාගයේ දී අප සියළු දෙනාට ද රට හැර යන්නට සිදු විය. ලන්ඩන් නුවර දී ද ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා ඇවර්බරි සාමිවරයා සමඟ එකට එක්ව මානව අයිතීන් සුරැකීමේ කටයුතුවල දිගටම නියැලී සිටි බව මට ඔස්ට්‍රේලියාවේ දී දැන ගන්නට ලැබුණි. කණගාටුවට මෙන්, ඔහු සමඟ සම්බන්ධතාවයක් ගොඩ නඟා ගන්නට මා ගත් උත්සාහයන් කිසිවක් සාර්ථක වූයේ නැත. ඒ ගමන් ගන්නට ඔහු තෝරා ගෙන තිබුන දේශපාලන මාවත මා දරන දේශපාලන අදහස් සමඟ නොගැළපෙන බැවින් විය හැකිය.

කෙසේ වෙතත්, මම හැම විටකම අසමසම හා නිර්භීත මානව හිතවාදියෙකු වූ ප්‍රින්ස් සහෝදරයාට මගේ ගෞරවය පල කර සිටිමි. දේශපාලනික මතභේද තිබුනේ වුවද, තම මුළු ජීවිත කාලයම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කැප කළ ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා කෙරෙහි මා හැමවිටම දැක්වූ ගරුත්වයේ ත් ලෙන්ගතු කමේත් කිසිදු අඩු වීමක් සිදු වී නැත.

අවසාන වශයෙන් මමත් මගේ පවුලේ අයත් අපගේ ගැඹුරු සංවේගය, ප්‍රින්ස් සහෝදරයාගේ ආදරණීය බිරිඳ, දරුවන් සහ හිතවතුන් වෙත පළ කර සිටීමට කැමැත්තෙමු.

මානව අයිතිවාසිකම් පිළිබඳ පතාකයෙක් සහ ආදර්ශයක් වූ ප්‍රින්ස් ගුණසේකර සහෝදරය; නොමැකෙන සටහන් මතකයට නංවා ගනිමින් අප ඔබට ආචාර කරන්නෙමු. ඔබේ දායකත්වයන් අපට බොහෝ සේ අහිමි වනවා ඇත.

**26 වන පිටෙන්**

මෙහිදී මෙම අදහස් සහ ලිපිය ඉදිරිපත් කරන මා විසින් පහත සඳහන් අභියෝගයද ඉදිරිපත් කරමි.

විධායක ජනාධිපති ක්‍රමය සහ කැඳ සහ සුප් කෑලි පාර්ලිමේන්තු ක්‍රමය සුන්නත් දූලි කර පාර්ලිමේන්තුවට වගකියන බලය සහිත අග්‍රාමාත්‍ය වරයෙක් සහ අඩු කැබිනට් ඇමති මණ්ඩලයක් සහිත මා සඳහන් කල නව ව්‍යවස්ථාවක අනුව රජයක් පිහිටා සේවය කලයුතුය.

මෙහිදී තවත් වැදගත් කරුණු කීපයක් අප අවධානයට ගත යුතුයි.

ඒ එක්සත් ශ්‍රී ලංකා ජන රජය යටතේ කිසිම රටේ පුරවැසියෙකුව මොනම ආකාරයකින්වත් දේශපාලන පලිගැනීමක් නොවීමට ඉඩ සැලසිය යුතුය.

අපේ රටේ කවුරු මොනවා කිව්වත් තිස් වසරක කාලකන්නි යුද්ධය නිමාකිරීමට මුල් වූ ශ්‍රේෂ්ඨ පුද්ගලයෝ දෙදෙනකි. ඒ ගෝඨාභය රාජපක්ෂ සහ සරත් ෆොන්සේකා රටේ අවසනාවකට වීරසකවී ඇති මොහුන් දෙදෙනා එකට මිත්‍ර කර මොනම පක්ෂක් රජයක් පිහිටුවත් මේ දෙදෙනාගේ වටිනා සේවය රටට අනිවාර්යෙන්ම ලබාගතය යුතුය.

සම්බුදු නිර්මල දහම් පණිවුඩය සත්‍ය අප ක්‍රියාවලියෙන් පෙනුම් කල යුතුය. සෙසු ආගම් සමඟ අත්වැල් බැඳගෙන එසේ කටයුතු කළ හොත් සියළු දෙවි දේවතාවන් මේ රට එදා අතීතයේ රැක බලගත්තාමෙන්, සොබා දහමේ ආශිර්වාද මේ සුන්දර දිවයිනට ලැබේවි.

**(කරපු අපරාධ නිසාම මහා මුහුද පවා ගොඩ ගැලුවේය.)**

මෙම අදහස් සමුහය ඉදිරිපත් කරන මම ලෝකයේ  උතුම්ම රටක් වූ ශ්‍රී ලංකාවේ ඉපිද ලැබු දැනුමෙන් හැකියාවෙන් (සාමාන්‍ය දැනුමක් ලැබු අයෙක්) රටට සේවයක් කරන්න කාලකන්ණි දේශපාලන ක්‍රමය සහ දේශපාලන හැතිකරය නිසා කලකිරි රටින් පිටමන්ව ලොව වටගොස් පෙර කල පිනකට ඕස්ට්‍රේලියාව නැමති සාමකාමී රටේ පුරවැසියෙක්වී සතුටින් ජීවත් වෙන්නෙක්මි.

නමුදු පෞඩ ඉතිහාසයක් ඇති ලොව්තුර සම්බුදු හිමි පහස ලත්දේශය

“මම බොදුනුවෙක්මි, කිතුනුවෙක්මි, හින්දු භක්තියෙක්මි. මුස්ලිම් භක්තියෙක්මි” එසේත් නැතිනම්

“මම සිංහලය, මම දෙමළය. මම බර්ගර්ය, මම ශ්‍රී ලංකීකයෙක්මි” කියන්න පුළුවන් ලොව එකම රට නැවතත් එක්සත් ශ්‍රී ලංකාවක් වී ඉන්දියන් සාගරයේ මුතු ඇටය සේ බැබලේවා යන පහන් සිතින් මෙම අදහස් සමුහය ඔබ සෑම වෙත ඉදිරිපත් කරමි.